# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. } LCGD/R&D/පොදු/උරුමය/2023

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதි / Date } 2024.04. 29

සියලුම අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියලුම සහකාර ඉඩම් කොමසාරිස්වරුන්,

**<u>උරුමය II අදියරට අදාළව මැනුම් ඉල්ලීම් යැවීම සම්බන්ධවයි</u>**

උරුමය ජාතික වැඩසටහන යටතේ, මේ වන විට ඔබ විසින් eSlims පද්ධතිය වෙත යොමු කර ඇති අවසරපත්‍ර සඳහා මාගේ සමාංක හා 2024.03.01 දිනැති ලිපිය මඟින් ඒ සමඟ යොමු කර ඇති ලැයිස්තුවලට අදාළව මැන ඇති, ගැටලු රහිත ඉඩම් සඳහා නිදහස් ප්‍රදානපත්‍රයන් සකස් කිරීමට අවශ්‍ය "O" රේඛා චිත්‍ර සඳහා වන ඉල්ලීම් දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී වෙත යොමු කරන මෙන් දන්වා ඇත.

02. එසේම මේ වන විට eSlims පද්ධතිය වෙත ඇතුළත් කර නොමැති එහෙත් මැන ඇති ගැටලු රහිතව පවතින ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දුන් අවසරපත්‍ර හා දීමනාපත්‍ර සඳහා උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීමට අවශ්‍ය "O" රේඛා චිත්‍ර සඳහා වන ඉල්ලීම් යොමු කිරීමේදී එම අවසරපත්‍ර හා දීමනාපත්‍ර ඉඩම්වල නිවැරදි හිමිකරු/මුල් උරුමකරු නිදහස් ප්‍රදානපත්‍ර සඳහා ඉල්ලුම් කර ඇති බවට ක්ෂේත්‍ර පරීක්ෂාවක් මඟින් පරීක්ෂා කර බලා ඔබ විසින් සෑහීමකට පත්වේ නම්, එම ඉඩම් සඳහා "O" රේඛා චිත්‍ර සැකසීම වෙනුවෙන් ඉල්ලීම් ආ.ඒ.ආ.118 ආකෘතියෙන් (අදාළ පරිදි) මුද්‍රිත/විද්‍යුත් ක්‍රමවේදයෙන් කඩිනමින් දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. එහිදී කැබලි විස්තර ලැයිස්තුවට අදාළව යම් සංශෝධනයක් අවශ්‍ය වේ නම් ඒ සඳහා වන ඉල්ලීම ද ආ.ඒ.ආ. 118 ආකෘතිය සමඟ පහත දැක්වෙන ආකෘතිය අනුව ලිපියක් යොමුකළ යුතු වේ. එහිදී ඔබ විසින් යොමු කරනු ලබන ඉල්ලීම් නිසි වගකීමෙන් යුතුව යොමුකළ යුතුය. ඔබ විසින් මුද්‍රිත ආ.ඒ.ආ. 118 ආකෘති සමඟ සංශෝධන සඳහා වන ඉල්ලීමක් යොමුකරන විට මුද්‍රිත ක්‍රමයට යොමුකළ යුතු අතර විද්‍යුත් ක්‍රමවේදයට යොමුකරනු ලබන අවස්ථාවල එසේ සංශෝධනයක් අවශ්‍ය වේ නම් ඒ සඳහා වන ඉල්ලීම පද්ධතිය හරහා යොමුකිරීමට අවස්ථාව " උරුමය" නව eSlims මොඩියුලය මඟින් ලබාදී ඇත. එම සංශෝධන සඳහා ගාස්තු අය කිරීමකින් තොරව මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් කටයුතු කරනු ඇත.

03.තවද ඔබ විසින් උරුමය I අදියරට අදාළව යොමුකරනු ලැබූ ආ. ඒ. ආ. 118 ආකෘති සඳහා මෙතෙක් උරුමය "O" රේඛා චිත්‍ර ලැබී නොමැති අවස්ථාවල නැවත ආ.ඒ.ආ. 118 ආකෘති යොමු කිරීමෙන් තොරව අදාළ ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී සමඟ සාකච්ඡා කර එම ගැටලු විසඳා ගැනීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

04. ඒ අනුව ඔබ වෙත  උරුමය II අදියරට ලැබෙන අයදුම්පත් නිසි පරීක්ෂාවකින් අනතුරුව කඩිනමින් eSlims පද්ධතිය හරහා පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් මගින් මා වෙත ලැබීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස තවදුරටත් දන්වා සිටිමි.

කේ.ඩී.බන්ධුල ජයසිංහ,

ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත් :

| | | |
|---|---|---|
| 1.ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය | - | කරු.දැ.ගැ.ස |
| 2.ලේකම්, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | - | කරු.සැ.ගැ.ස |
| 3.මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව | - | ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් ඔබ වෙත ලැබෙන "O" රේඛා චිත්‍ර සඳහා වන ඉල්ලීම් වෙනුවෙන් කඩිනමින් රේඛා චිත්‍ර සකස් කර මා වෙත යොමු කිරීම සඳහා |
| 4. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් | - | කරු.දැ.ගැ.ස |

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ........................................

දිනය : ................................

ජ්‍යෝෂ්ඨ මිනින්දෝරු අධිකාරී,

........................................දිස්ත්‍රික්කය.

<u>උරුමය ජාතික වැඩසටහන සඳහා සකස් කරනු ලබන උරුමය **"O"** රේඛා චිත්‍ර සකස් කරනු ලබන ඉඩම් කැබලිවලට අදාළ කැබලි විස්තර ලැයිස්තුව සංශෝධනය</u>

........................................................ දිස්ත්‍රික්කයේ ........................................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ............................................ ගමේ ............................................... ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ............................................ පිඹුරේ කැබලි අංක .................................. හි කැබලි විස්තර ලැයිස්තුව පහත පරිදි සංශෝධනය විය යුතු වේ.

එම ඉඩමට අදාළව අවසරපත්‍රකරු/දීමනාපත්‍රකරු ........................................................................ ලෙස සංශෝධනය කරන්න.

වෙනත් සංශෝධන ඇත්නම්, ……………………………………………………………………..

ඒ අනුව අදාළ සංශෝධන සිදු කර මා විසින් යොමු කරන ලද ආ.ඒ.ආ. 118 ආකෘතිය අනුව උරුමය "O" රේඛා චිත්‍ර නිකුත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

....................................

ප්‍රාදේශීය ලේකම්

…………… ප්‍රාදේශීය ලේකම් කාර්යාලය